ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන අංශය
සමාජ විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - 1 වන මට්ටම
අවසාන පරීක්ෂණය
අධ්‍යයන වර්ෂය - 2007
ශ්‍රී ලංකාවේ නූතන ඉතිහාසය - SSF 1301

කාලය : පැය තුනයි (03)

| දිනය : 2007.10.08 | වේලාව : පෙ.ව. 9.30 - ප.ව. 12.30 |
|---|---|

එක් කොටසකින් අවම වශයෙන් <u>එක් (01) ප්‍රශ්නය</u> බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ)

## <u>පළමුවන කොටස</u>

1. 14 වන ශතවර්ෂයෙන් පසු යුරෝපයේ ඇතිවූ පුනරුදයට සහ ආගමික ප්‍රතිසංස්කරණවලට මූලික වූ හේතු සහ එහි ප්‍රතිඵල ලුහුඬින් විස්තර කරන්න.

2. ප්‍රථම විදේශීය ආක්‍රමණිකයන් වශයෙන් ශ්‍රී ලංකා දේශපාලනයට පිවිසි පෘතුග්‍රීසීන්ගේ බලපෑම නිසා ශ්‍රී ලංකා සමාජය තුළ ඇතිවූ ආර්ථික, දේශපාලන හා සමාජ වෙනස්වීම් ගැන රචනයක් ලියන්න.

3. පෘතුගීසීන් සහ ලන්දේසීන් සිය පාලනය යටතේ තබාගෙන තිබූ ප්‍රදේශවල ගෙන ගිය පාලනයේ තිබූ සමාන හා අසමාන ලක්ෂණ සාකච්ඡා කරන්න.

## <u>දෙවන කොටස</u>

4. 1505 සිට විදේශීය ආක්‍රමණික ජාතීන් තුනකගෙන් රට බේරාගැනීමට ගත් පියවරවල්වලට විශේෂ අවධානය යොමු කරමින් කන්ද උඩරට රාජධානිය බිහිවූ දා සිට පැවැති රජ පෙළපත් පිළිබඳ විස්තරයක් කරන්න.

5. 16 වන ශත වර්ෂය මුල් කාලයේ ශ්‍රී ලංකාව තුළ පැවැතියේ ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් බවට හඳුනාගෙන ඇත. මෙම ස්වයංපෝෂිත අර්ථක්‍රමයේ විශේෂ ලක්ෂණ උදාහරණ සහිතව විග්‍රහ කරන්න.

6. (අ) 1818 සහ 1848 කන්ද උඩරට ප්‍රදේශවල ඇතිවූ කැරලිවලට බලපෑ හේතු මොනවාද?
   (ආ) එම කැරලි හේතුකොට ගෙන ශ්‍රී ලංකාවේ පරිපාලනය සම්බන්ධව බ්‍රිතාන්‍ය පාලනය ඇතිකල වෙනස්කම් මොනවාද? විස්තර කරන්න.

## තුන්වන කොටස

7. ද්වි අර්ථක්‍රමය යනු කුමක්ද? වැවිලි කෘෂිකර්මය හඳුන්වාදීමෙන් පසු ශ්‍රී ලංකා ආර්ථිකය ද්වි අර්ථක්‍රමයක් බවට පත්වූ ආකාරය විස්තර කරන්න.

8. පහත සඳහන් මාතෘකා **<u>තුනක් (03)</u>** ගැන කෙටි සටහන් ලියන්න.
   - (අ) පිළිමතලාවේ මහ අධිකාරම්
   - (ආ) රොබට් බ්‍රවුන්රිග්
   - (ඇ) ධාන්‍ය බදු ක්‍රමය
   - (ඈ) රාජ්‍ය නිර්බාධවාදය සහ ශ්‍රී ලංකාවේ යටත්විජිත පාලනය
   - (ඉ) උපයෝගිතාවාදය

9. බ්‍රිතාන්‍ය පාලකයන් විසින් හඳුන්වා දුන් මහා මාර්ග සහ දුම්රිය ප්‍රවාහනය ශ්‍රී ලංකාවේ පාරම්පරික ආර්ථික හා සමාජීය අංශ කෙරෙහි (විශේෂයෙන් කන්ද උඩරට ප්‍රදේශවල) ඉමහත් බලපෑමක් ඇතිකරන ලදි. නිදසුන් සමග අදහස් දක්වන්න.

***** සියළුම හිමිකම් ඇවිරිණි *****